**ක්‍රමවේදයක්ද අනුගමනය කරන්නේ ?**

මම හැම වෙලාවෙම දර්ශණ ඒ ආකාරයෙන්ම රූපගත කරනවා. අනෙකුත් ශිල්පීන්ගෙනුත් බොහෝ වෙලාවට ඒකට හොඳ සහයක් ලැබෙනවා. ඒ වගේ මට අමතක නොවෙන එක අවස්ථාවක් තමයි දඩයම චිත්‍රපටයේ අවසන් රූප පෙළ රූ ගත කරපු වෙලාව. ඒකෙ තිබුණෝ රවින්ද්‍ර රන්දෙණිය කාර් එකට හප්පලා ස්වර්ණාව මරා දමන අවස්ථාව. මේක රූපගත කළේ විල්පත්තුව කැලේ. පැයට කිලෝ මීටර් සීයක විතර වේගයෙන් කාර් එක පදවගන ඇවිත් ස්වර්ණාව හප්පවන්නයි තිබුණේ. ඒ වෙලාවේ ස්වර්ණා පොල්ලකින් වින්ඩ්ස්ක්‍රීන් එකට ගහනවා. වින්ඩ්ස්ක්‍රීන් එක කුඩු වෙනවා. මේක ගන්න ලෑස්තිවෙලා මම රවින්ද්‍රට කිව්වා වීදුරු කුඩු ඇස්වලට වදින්න පුළුවන් නිසා ඔයා සන් ග්ලාස් එක දාගෙන මේක කරන්න. අපි සංස්කරණයේදී ඒක නොපෙනෙන්න හදාගමු කියලා. රවින්ද්‍ර ඒකට කැමති වුණේ නෑ. කතාවේ තියන විදිහටම සන්ග්ලාස් නැතුවම මම මේක කරන්නම්. මම ඇස් දෙක බේරගන්නම් කියලා රවින්ද්‍ර කිව්වා.
මේ දර්ශණය ගැන රවින්ද්‍රට හොඳ අවබෝධයක් තිබුණා. එයා ස්වර්ණාට කිව්වා ඔයා පොල්ලෙන් වින්ඩ්ස්ක්‍රීන් එකට ගහපු ගමන් පොල්ල අතඇරලා පැත්තකට වෙන්න එහෙම නැතිවුණොත් පොල්ලත් එක්කම ඔයා කාර් එක උඩට වැටිලා ඉස්සරහට ඇදිලා යයි කියලා. දර්ශණය ඒ විදිහටම කළා. රවින්ද්‍රගේ කාර් එක නැවතුන තැනට මම දුවලා ගියා මොකද වුණේ කියලා බලන්න. අත්දෙක පපුව හැමතැනම වීදුරු කටුවලට තුවාල වෙලා ලේ ගලනවා. ඒත් වාසනාවකට වගේ ඇස් දෙක බේරගන්න රවින්ද්‍රට හැකිවෙලා තිබුණා.

වල්මත්වූවෝ කරන්න ගිහිල්ලා නිළියක් හොයාගන්න හරි අමාරු වුණා. මොකද ඒකෙ එක තැනක තියනවා ඇඳුම් ගලවල සම්පූර්ණයෙන්ම නිරුවත් වෙන අවස්ථාවක්. කොහොම හරි අන්තිමේදී පිටරටක ඉදලා ආව කෙනෙක් මේ චරිතය කරන්න කැමති වුණා. මේක ගන්න වෙලාවේ මමයි, කැමරා ශිල්පියයි, ලයිටිස් කරපු කෙනයි ඇර අනෙක් ඔක්කොම එතනින් අයින් කළා. ඒත් දැන් මේ නිළිය ඇඳුම් ගලවන්න අදිමදි කරනවා. මම කිව්වා නිකර් එක ගලවන්න ඕනේ නෑ. හැබැයි බ්‍රෙසියර් එක ගලවන්න. නැත්නම් මම ගලවනවා කියලා. පස්සේ ඇය ඒක ගැලෙව්වා. ඒ විදිහට හැකි උපරිමයෙන් ඒ දේ කරන්නයි මම උත්සාහ කරන්නේ. හැබැයි සමහර අවස්ථා තියනවා ඒ විදිහටම ගන්න බැරි. දඩයම චිත්‍රපටියේ ස්වර්ණාව කාර් එකේ හප්පවන දර්ශණයේදී අපි පාවිච්චි කළේ පඹයෙක්. පඹය ටිකක් දිරලා හිටිය නිසා අපි බයේ හිටියේ කාර් එකේ වැදුන ගමන් පඹය දෙකට කැඩෙයිද කියලා. පුදුමෙ කියන්නේ වදිනවත් එක්කම පඹය මැදින් නැවිලා බොනට් එක උඩට පාත් වුණා.

**ඔබගේ පෞද්ගලික ජීවිතය ගොඩනැගුනේ මොන විදිහටද ?**

මගේ වැඩි අවධානයක් තිබුණේ සිනමාවට නිසා ජීවිතයේ වැඩි කාලයක් ගත වුණේ ඒ වෙනුවෙන්. මම විවාහ වුණේ වයස අවුරුදු තිස් හතේදි. ඒක යෝජනාවකින් සිදුවුණේ. එයා ස්වර්ණා ද රොසයිරෝ. පෞද්ගලික පාසලක ගුරුවරියක් විදිහට රැකියාව කරලා පස්සේ අභ්‍යන්තර සැළසුම් ශිල්පිනියක් විදිහට ඇය වැඩ කළා. අපිට දරුවෝ දෙන්නෙක් ලැබුණා. මුලින්ම පුතා. අසංග ඔබේසේකර. දැන් පෞද්ගලික ආයතනයක අලෙවි කළමණාකරුවෙක් විදිහට වැඩ කරනවා. විවාහවෙලා දරුවෙකුත් ඉන්නවා. දෙවැනියා දුව කණිෂ්කා ඔබේසේකර. ඇයත් විවාහ වෙලා දරුවෙක් ඉන්නවා. දුව මුල් කාලෙදි පේන්ටින්ග්වලට දක්ෂකම් දැක්වුවා. ඒත් දෙන්නගෙන් එක්කෙනෙක්වත් සිනමාව පැත්තට යොමුවුණේ නෑ. ඒ අයට කැමති පැත්තකට යන්න උදව් දෙනවා ඇරෙන්න දරුවන් සිනමාවට යොමු කරවන්න මට වුවමනාවක් තිබුණේ නෑ.

**යම් කාලයක ඉහළ ජනප්‍රියත්වයක ඉන්න සිනමා ශිල්පියෙකුට කොතනත් හොඳ ඉල්ලුමක් තියනවා. විශේෂයෙන්ම නිළියන් අතරේ පවා. ඔබ යෝජනාවකින් විවාහ වෙන්නේ ඔබට නිළියක් ගැන උනන්දුවක් තිබුණේ නැත්ද ?**

මම චිත්‍රපටියක් කරන කොට දැඩි විනයක් පවත්ව ගන්න කෙනෙක්. නිළියන් කියන්නේ මට මගේ නිර්මාණයේ කතා චරිතයක් විතරයි. ඒ චරිතය කොතෙක් දුරට ඇයගෙන් කෙරෙනවද කියන එක ගැන මිස ඒ අය ගැන මට වෙනත් කිසිම දෙයක් හිතෙන්නේ නෑ. හැඟීමක් දැනෙන්නේ නෑ. වෙනස් ආකාරයේ සම්බන්ධතාවයක් ඇතිකරගන්නෙත් නෑ. නිළියන් එක්ක විතරක් නෙවෙයි චිත්‍රපටි කරනකොට මම අනෙක් ශිල්පීන් එක්ක කිසිම විශේෂ යාලු මිත්‍ර කමක් පවත්වන්නේ නෑ. මොකද තිහක් හතලිහක් එක්ක වැඩ කරද්දි එහෙම කරන්න ගියොත් මේ අයව පාලනය කරගෙන මගේ කටයුත්ත සාර්ථකව කරන්න අමාරුවෙනවා. මම උදේම ලොකේෂන් එකට යනවා. ඒ වෙනකොට අනෙක් හැම දෙයක්ම ලෑස්තිවෙලා හැම කෙනෙක්ම ඇවිල්ල ඉන්න ඕනේ. ෂූටින් ඉවර වෙනකම් කිසි කෙනෙකුට බොන්න අවසරයක් නෑ. මගේ මේ තද ගති නිසා ඒ කාලේ මට කට්ටිය කියන්නේ 'මරුමුස්' කියලා.

**මේ වෙනකොට ඔබේ ජීවිතය ගෙවෙන්නේ කොහොමද ?**

දැන් මම සියලු බැඳීම් අතහැරලා මේ පුංචි ගෙදරට වෙලා තනියම ඉන්නවා. මගේ උදව්වට ස්වර්ණා ඉන්නවා. මෙහෙම ඉන්න ගමන් මම වැඩිපුරම කරන්නේ පොත් කියවන එක. කෑම බීම බේත් හේත් වගේ දේවල්වලට උවමනා මුදල් හොයාගන්න කෙටි චිත්‍රපට නිර්මාණය කිරීම සැරෙන් සැරේ කෙරෙනවා. ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනයේ පහුගිය කාලේ වැඩ කරද්දි මාසෙකට රුපියල් පනස් දාහක් විතර ලැබුණත් එතනින් මාව අයින් කළාට පස්සේ නිශ්චිත ආදායම් මාර්ගයක් දැන් මට නෑ. මට තිබුණ ගේ දොර ඉඩකඩම් ඔක්කොමත් මම දරුවන්ටයි සහෝදරියටයි ලියලා දීලා ඒ හැම දෙයකින්ම අයින් වෙලා ඉන්නේ. දරුවෝ කියනවා ඒ අය ළඟට එන්න කියලා. ඒත් මම යන්නේ නෑ. මම කැමති නෑ කාටවත් කරදරයක් වෙන විදිහට ජීවත් වෙන්න. රූපවාහිනී අභ්‍යාස ආයතනයේ ඉන්න කාලේ මගේ දැනුම අලුත් පරපුරට ලබාදෙන්න පුළුවන් වුණා. ඒකෙන් මට විශාල සතුටකුත් ලැබුණා. තවදුරටත් වෘතාන්ත චිත්‍රපටි කරන්න මගේ අදහසක් නෑ. මම හිතන්නේ මම කළ චිත්‍රපටි 13 තුළින්ම මම කියන්න තියන හැම දේම වගේ කියලා තියනවා. අන්තිමට කළ ආගන්තුකයා චිත්‍රපටියත් සමග මේ සමාජයත් සමග මට කරන්න තිබුණ දේශපාලන සංවාදය මම අවසන් කළා කියලයි මට හිතෙන්නේ. ආගන්තුකයා මරණ මංචකයට ගෙනගිය දේශපාලකයා අදත් යෙහෙන් වැජඹෙනවා. වර්ථමානයේ අපි අත්විදින දේශපාලන යථාර්තය ඒකයි.

**ඔබට ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනයේ සභාපති තනතුර දෙන්නේ කාලයක් ඔබේ සමීප මිතුරෙක් වුණ නිතර නිතර ඔබේ නිවෙසට ආව ගිය පුද්ගලයෙකු වූ වර්ථමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ. කොහොමද මේ තනතුර අහිමි වුණේ ?**

අහිමි වුණේ කොහොමද කියන්න මමත් හරියටම දන්නේ නෑ. මගේ තනතුරට තරුණයෙක් පත්කරලා එවලා තිබුණා. මම ගෙදර නැවතුණා. මහින්ද විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න කාලේ ධර්මසිරි සේනානායක එක්ක මාසෙකට සැරයක් විතර බොල්ගොඩ ගඟ අයිනේ තිබුණ මගේ ගෙදරට එනවා. රෑ කෑම කාලා පැය ගනන් දේශපාලනය ගැන කතා කර කර ඉන්නවා. ඔහු ජනාධිපති වුණාට පස්සේ මට කතාකරලා තනතුරු ගණනාවක් දෙන්න හැදුවා. මම කිව්වා මම චිත්‍රපටි කළා මිසක් කැම්පස් එකෙන් අවුට් වෙච්ච දා ඉදළා පරිපාලනය කරලා නෑ ඒ නිසා මට ඔය තනතුරු එපා කියලා. අන්තිමේ රූපවාහිනී අභ්‍යාස ආයතනය බාරගත්තේ මගේ දැනුමෙන් යමක් කරන්න පුළුවන් තැනක් නිසයි. ඒ විදිහටම මම ඒක කරගෙන ආවා. ඒත් දැන් අපිට දේශපාලන වටිනාකමක් නෑනේ. අනික මම දේශපාලකයන්ට කඩේ යන්න ලෑස්ති මිනිහෙකුත් නෙවෙයිනේ. අසාදාරණයෙදී මම කිසිම දේශපාලකයෙක් ලග හිස නමන්නෙත් නෑ. ඒ නිසා මාව ඉවත් කරන්න ඇති.

**ඔබ සිනමාව තුළ පමණක් නෙවෙයි ඉන් බැහැරව පක්ෂ දේශපාලනයේත් කාලයක් නිරත වුණ කෙනෙක් විදිහට එදා මෙදා දේශපාලනය දකින්නේ මොන විදිහට ද ?**

මම මීගම කොමියුනිස්ට් පක්ෂ ශාඛාවක් පිහිටවූවේ මට වයස අවුරුදු දාහතේදි. අපේ තාත්ත වාමාංශික දේශපාලකයන් සමග පවත්වපු සමීප සම්බන්ධතා තමයි මගේ දේශපාලන නැඹුරුවට මූලිකවම බලපෑවේ. ඇන් එම් එක්ක රුවන්වැල්ලේ මැලේරියා මර්ධන ව්‍යාපාරයේ යෙදිලා තාත්තට මැලේරියාවත් හැදුණා. ඇන් ඇම්, පීටර් කෙනමන් නිතර මීගම අපේ ගෙදරටත් ඒ කාලේ එනවා යනවා. මේ අය ඉතාම සුන්දර මිනිස්සු. මේ අයට දේශපාලන දැක්මක් තිබුණා. පොදු යහපත වෙනුවෙන් සැකසුණ න්‍යාය පත්‍රයක් තිබුණා. ඒ කාලේ දේශපාලකයොත් එක්ක ගත්තම අද ඉන්නෙ මොක්කුද ?


YSL

Migration Services

ශ්‍රී ලාංකික ඔබට
සොඳුරු සේවය

We specialise in

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Lead Design House

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805

Now also available for consultation at
Bundoora
(Close to Latrobe university , RMIT and NMIT)

6 Mat Rush Avenue, Bundoora, VIC 3083

Tel: 03 9467 4468

yasho@yslmigration.com

MIGRATION AGENT
REGISTERED
mara.com.au
REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA